*සැ. යු.* -මෙවර ගැසට් පත්‍රයේ V කොටසේ 2007 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ. 2010.08.13 වැනි දින පළ වූ අංක 1,667 දරන *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය. මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,668 - 2010 අගෝස්තු මස 20 වැනි සිකුරාදා - 2010.08.20**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )


| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1460 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1464 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1466 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 අගෝස්තු මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 අගෝස්තු මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු ඇබෑර්තු

## මධ්‍යම පළාත් සභා රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාව සඳහා රියදුරු/මාර්ග කම්කරු/(කොන්ත්‍රාත් පදනම) /සෞඛ්‍ය කම්කරු/විදුලි කම්බිකරු තනතුරු සඳහා බඳවාගැනීම

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වත්තේගම නගර සභාවේ පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති වත්තේගම නගර සීමාව තුළ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම්පත් 2010.09.06 දිනට පෙර "ලේකම්, වත්තේගම නගර සභාව, වත්තේගම" ලිපිනයට ලැබෙන පරිදි ලියාදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයෙ වම් කෙළවර ඉහළ කොටසේ වත්තේගම නගර සභාවේ ඉල්ලුම්කරන තනතුර සඳහන් කළ යුතුය. (වත්තේගම නගර සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, ආදේශක සේවකයින්ට ප්‍රමුඛතාවය දක්වනු ලැබේ.)

| *තනතුරු නාමය* | *පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|
| රියදුරු III පන්තිය | 02 | 06./2006 iv-PL3<br>රු.12,470-130x10-145x10-160x10-170,x12 -රු. 18,860 | අ.පොස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| සෞඛ්‍ය කම්කරු | 01 | 06./2006 iv-PL1<br>රු.11,730-120x10-130x10-145x10-160x12-රු.17,600 | අවම වශයෙන් 8 වැනි ශ්‍රේණිය (9 වසර) සමත්විය යුතුය. |
| විදුලි කම්බිකරු | 01 | 06./2006 iv-PL1<br>රු.13,060-130x10-145x10-160x12-17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව හා ගණිතය සමග විෂයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| මාර්ග කම්කරු (කොන්ත්‍රාත් පදනම) | 04 | 06./2006 iv-PL1<br>රු.13,060-130x10-145x10-160x12-රු.17,600 | අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය. |

*රියදුරන් බඳවා ගැනීමේ ක්‍රමය :*

1. සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතු ය.
2. ලිඛිත පරීක්ෂණයෙන් සමත් වන්නාවූ අයදුම්කරුවන් පත් කිරීමට පෙර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් මෝටර් වාහන පරීක්ෂකවරයෙකු හා පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකුගෙන් ද, එක් මාණ්ඩලික නිලධාරියෙකුගෙන් ද, සමන්විත තිදෙනකුට නො අඩු මණ්ඩලයක් මගින් පවත්වනු ලබන රිය පැදවීමේ නිපුණත්වය මැනීමේ වෘත්තීය පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.
3. සේවයට බඳවාගැනීම අදාළ පලාත් පාලන ආයතනයේ පත්වීම් බලධරයා විසින් සිදු කරනු ලැබේ.

*රියදුරන් බඳවා ගැනීමේ සුදුසුකම් :*

1. ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතුයි. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වත්තේගම නගර සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතු ය.
2. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
3. අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල/දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයයන් හයකින් සාමාර්ථ ලබා තිබිය යුතු ය.
4. අවම උස අඩි 5 අඟල් 2.5ක් විය යුතු ය.
5. දිවා කාලයේ දී සහ රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස ශාරීරික වශයෙන් සුදුසු තත්ත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.

*රියදුරන් සඳහා වෘත්තීය සුදුසුකම් :*

1. රියදුරු III ඛණ්ඩයට බඳවා ගැනීමේ දී පෞද්ගලික/කුලී රථ සහ තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා සිටිය යුතු ය. (බඳවාගන්නා දිනට වසර 03කට පෙර අදාළ සහතිකය ලබා සිටිය යුතු ය. වාහන පන්ති සී සහ සී1)

*විදුලි කම්බිකරු සඳහා වෘත්තීය සුදුසුකම් :*

1. වෘත්තීය පිළිබඳ ශිල්පීය දැනුම ලිඛිතව තහවුරු කළ යුතු ය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි (මාර්ග කම්කරු හැර) :*

- මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය.
- එසේම රාජ්‍ය සේවා පත්කිරීම් ආදළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

- තෝරාගනු ලබන්නන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත් වන අතර, එම කාලය තුල වැඩ, හැසිරීම, පැමිණීම සතුටුදායක තත්ත්වයක නොමැති වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

*මාර්ග කම්කරු සඳහා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

- මෙම තනතුරු කොන්ත්‍රාත් පදනම මතය. විශ්‍රාම වැටුප් රහිතය.

*වෙනත් පොදු කොන්දේසි :*

- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතු ය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)
- අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකික විය යුතු ය.
- විශිෂ්ඨ චරිතයකින් සහ මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය. තෝරා ගනු ලැබුවහොත් මාසයක් ඇතුළත රජයේ වෛද්‍යවරයෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර, එම පරීක්ෂණයේදී ශාරීරික වශයෙන් නුසුදුසු බව පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
- දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරකරුවෙකු වී දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.
- අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වත්තේගම නගර සීමාව තුළ යටත් පිරිසෙයින් වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචිය ඇති අයෙක් විය යුතුය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතු ය.)
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු අතර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 44/90 යටතේ විශ්‍රාම ලැබූවෙකු නොවිය යුතු ය.
- රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනට පූර්වාසන්න වන අවුරුදු 05ක කාලය තුළ වරදකට (අවවාද කිරීම හැර) දඬුවමක් ලබා නැත්තා වූ ද, මෙම කාලය තුළ යෙදුණු වැටුප් වර්ධක නිශ්චිත දිනට ලබාගත්තා වූ ද, සතුටුදායක සේවා කාලයක් තිබිය යුතු ය. තෝරාගනු ලැබුවහොත් ඔවුන් වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට තවදුරටත් දායක විය යුතු ය.
- වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව අයදුම්කරු ත්‍රිවිධ හමුදාව හා ආරක්ෂක සේවයේ නිරත වී සිට විධිමත් පරිදි සේවයෙන් මුදා නොහැරි අය නොවිය යුතු ය.
- මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, මධ්‍යම පළාත් සභාව හෝ වත්තේගම නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*අයදුම්කළ යුතු ආකාරය* .- මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර පහත සඳහන් සහතිකවල ඡායාස්ථ පිටපත් සමග 2010.09.06 දිනට ප්‍රථම මා වෙත ලැබෙන්න සලස්වන්න.

1. උප්පැන්න සහතිකය
2. අධ්‍යාපන සහතික
3. පදිංචිය පිළිබඳව ප්‍රාදේශීය ලේකම්ගේ සහතිකය
4. මෑතකදී ලබාගත් චරිත සහතිකය

ලේකම්,
වත්තේගම නගර සභාව.

2010 ජූලි මස 30 වැනි දින දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**
**වත්තේගම නගර සභාව**

***............................................ තනතුර සඳහා වන ආදර්ශ අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
02. ස්ථිර ලිපිනය :————.
03. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————.

05. උපන් දිනය: වර්ෂය:————. මාසය:————. දිනය :————.
06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————.
07. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
08. විවාහක/අවිවාහකබව :————.
09. ශ්‍රී ලාංකික පුරවැසියෙකු වන්නේ උපතින් ද ලියාපදිංචිවීමෙන් ද යන වග :————.
10. අධ්‍යාපන සුදුසුකම්(සහතික වල පිටපත් ඇමිනිය යුතුය.) :————.
අ.පො.ස. (සා. පෙළ) විභාගය
සමත් වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

11. (1) වෙනත් අධ්‍යාපන සුදුසුකම් :————.
(2) වෘත්තීය සුදුසුකම් :————.
(3) සේවා පළපුරුද්ද :————.
12. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවය නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුරු :————.
ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් ආදේශක යන වග ද :————.
එම තනතුරට පත්වූ දිනය :————.

13. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. ඉහත සඳහන් තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා සේවයට බඳවා ගැනීමට පෙර නුසුදුස්සෙකු වන බව හා පත්වීම ලැබීමෙන් පසුව එය ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් ද රහිතව සේවයෙන් පහ කිරීමට යටත් වන බව ද දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුක්ත වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු/ඉල්ලුම්කාරිය වන ............................................ මහතා/මහත්මිය/මෙනවිය මෙම ආයතනයේ ........................................ වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරාගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

08-407

---

**පැලියගොඩ නගර සභාව**

පැලියගොඩ නගර සභාවේ තනතුරු පුරප්පාඩු

පැලියගොඩ නගර සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් තනතුරට සුදුස්සන් තෝරාපත්කර ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු සංඛ්‍යාව* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | 03 | රියදුරු 11 ශ්‍රේණිය ආ | මාසිකව රු.12,740-10x130-10x145-10x160-12,x170 -18,860 රා. ප.චක්‍රලේඛ 06./2006-( iv)-PL03-2006A | i. අවම වශයෙන් 09 වසර (08 ශ්‍රේණිය) සමත්වීම.<br>ii. සියලු වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුනතා සහතිකය ලබාතිබිය යුතුය. |

iii. රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු රියදුරෙකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබි යයුතුය. මෙය ට්‍රැක්ටර් (ටේලරය සහිත) පැදවීම පිළිබඳ මනා පලපුරුද්දක් තිබීම අමතර සුදුසුකමක් සේ සලකනු ලැබේ. (සහතික මගින් සනාථ කළ යුතුය.)

iv. අවම වශයෙන් උස අඩි 05ක් වත් තිබිය යුතුය.

v. දිවා කාලයේ දී හා රාත්‍රි කාලයේ දී සේවයේ යෙදීම පිණිස මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයක් තිබිය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතුය.

vi. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ මනා දැනීමක් තිබිය යුතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

1. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
2. පත්වීම වසර තුනක පරිවාස කාලයකට යටත් වේ.
3. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි දෙපාර්තමේන්තු නියෝග, බස්නාහිර පළාත් සභාව විසින් හා පෑලියගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන නියෝග වලට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*බඳවා ගැනීමේ සුදුසුකම් :*

1. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.
2. විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය.
3. අයදුම්පත් භාරගන්නා දිනට පූර්වාසන්න වර්ෂ තුනක බස්නාහිර පළාතේ පදිංචිය සනාථ කළ යුතුය.
4. අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි අය විය යුතුය. එහෙත් දැනටමත් රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු සේවකයින් සඳහා මෙම උපරිම වයස් සීමාව අදාළ නොවේ.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය පෑලියගොඩ නගර සභාවේ ලේකම් සතුය.

*අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :*

අයදුම්පත් පහත සඳහන් ආකෘතිය අනුව පිළියෙල කර ඉල්ලුම් කරන තනතුර ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ ලියා 2010.09.20 දිනට පෙර "ලේකම්, පෑලියගොඩ නගර සභාව, පෑලියගොඩ" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් සමග මෙහි පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් එවිය යුතුය.

1. උප්පැන්න සහතිකය,
2. අධ්‍යාපන සහතික,
3. පදිංචිය සනාථ කිරීමේ සහතිකය,
4. මෑතක දී ලබාගත් ග්‍රාම සේවා සහතිකය,
5. වෘත්තීය සහ සේවා පලපුරුද්ද පිළිබඳ සහතික,
6. ජාතික හැඳුනුම්පත,
7. රියදුරු බලපත්‍රය.

අවම සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ඇම්. ඩී. ගුණරත්න,
ලේකම් *(වැ.බ.),*
පෑලියගොඩ නගර සභාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ රියදුරු "11 (ආ)" තනතුර සඳහා බඳවා ගැනීම***

01. මුලකුරු සමග නම :—————.
    මුලකුරුවලින් හැඳින්වෙන නම් :—————.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :—————.
03. ස්ථිර ලිපිනය :—————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :—————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. උපන් දිනය: අවුරුද්ද:————. මාසය:————. දිනය :————.
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස : අවුරුදු:————. මාස :————. දින :————.

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද ලියාපදිංචියෙන් ද :————.

08. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග/වසර, ශ්‍රේණිය)
(i) සමත් වූ වසර/ශ්‍රේණිය :————.
(ii) අ.පො.ස. (සා. පෙළ) විභාගය :————.
(i) විභාග වර්ෂය හා මාසය :————.
(ii) සමත් වූ විෂයයන්

| විෂයය | ශ්‍රේණිය |
|---|---|
| | |

09. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.)

10. සේවා පළපුරුද්ද (සහතික මගින් සනාථ කළ යුතුය.)

11. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම් පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු සඳහන් කර ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට හේතු වන බව ද මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

*දැනටමත් රාජ්‍ය සේවයේ, පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ............................................ මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ........................................ කු වශයෙන් ඔහු/ඇය සේවෙයන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දෙපාර්තමේන්තුව/ආයතනය :————.
නිල මුද්‍රාව :————.
දිනය :————.

08-399

# පළාත් පාලන නිවේදන

## තුම්පනේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර මධ්‍යම පළාතේ පළාත් සභාවේ, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයෙහි දක්වා ඇති මංමාවත් තුම්පනේ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

මෙම මංමාවත් සම්බන්ධයෙන් ඉඩම්වල අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශවයන් විසින් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනයේ සිට එක් මාසයක ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වගන්ති ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙමි.

කේ. ජී. උපාලි කුමාරසිංහ,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

## උපලේඛනය

| අංකය | පාරේ නම | දිග | පළල |
|---|---|---|---|
| 01. | අම්බාව මුගුණගහ අසල සිට පිල්ලෑව දක්වා මාර්ගය | අඩි 1372 | අඩි 08 |

*දකුණුපස ඉඩම්හිමියෝ*

01. ටී. එම්. රණවීර - අම්බාව, හතරලියද්ද
02. ජී. ජී. ගුණරත්න - අම්බාව, හතරලියද්ද
03. ටී. එම්. රත්නායක - අම්බාව, හතරලියද්ද
04. ටී. එම්. ප්‍රේමාවතී -අම්බාව, හතරලියද්ද
05. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
06. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
07. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
08. ටී. එම්. රත්නායක - අම්බාව, හතරලියද්ද
09. ටී. එම්. සරත් කුමාර - අම්බාව, හතරලියද්ද
10. ටී. එම්. සරත් කුමාර - අම්බාව, හතරලියද්ද
11. කේ. එම්. කුලසේකර - අම්බාව, හතරලියද්ද

*වම්පස ඉඩම්හිමියෝ*

01. ටී. එම්. රණවීර - අම්බාව, හතරලියද්ද
02. ජී. ජී. ගුණරත්න - අම්බාව, හතරලියද්ද
03. ටී. එම්. රත්නායක - අම්බාව, හතරලියද්ද
04. ටී. එම්. රත්නායක-අම්බාව, හතරලියද්ද
05. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
06. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
07. ටී. එම්. විජේරත්න - අම්බාව, හතරලියද්ද
08. ටී. එම්. රත්නායක - අම්බාව, හතරලියද්ද
09. ටී. එම්. සරත් කුමාර - අම්බාව, හතරලියද්ද
10. ටී. එම්. රත්නායක - අම්බාව, හතරලියද්ද
11. කේ එම්. කුලතුංග - අම්බාව, හතරලියද්ද

08-398/1

---

## තුම්පනේ ප්‍රාදේශීය සභාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ තුම්පනේ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පහත සඳහන් උපලේඛනයේ සඳහන් මංමාවත් මෙම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කළ යුතු යැයි 2010.01.22 දින පැවති මහා සභාවේ දී සම්මත වූයෙන් මෙම මංමාවත් මෙම ප්‍රාදේශීය සභාව සතු මංමාවත් ලෙස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

කේ. ජී. උපාලි කුමාරසිංහ,
සභාපති,
තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

තුම්පනේ ප්‍රාදේශීය සභාව - ගලගෙදර.

## උපලේඛනය

| අංකය | පාරේ නම | දිග | පළල |
|---|---|---|---|
| 01. | හද්දාපිටිය ග්‍රාමසේවා වසමට අයත් වැව්වේදෙනිය කුඹුරෙන් ආරම්භ වී ඉහළගම හරහා විහාරතැන්න මාර්ගය දක්වා ඇති මාර්ගය | අඩි 1272 | අඩි 08 |

*දකුණුපස ඉඩම්හිමියෝ*

01. ඇල
02. ජේ. එම් රන්බණ්ඩා මහතාට අයත් ගොඩ ඉඩම
03. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
04. ඩී. බී. කළුගල්ල මහතාට අයත් ගොඩ ඉඩම
05. එස් එම්. හීංබණ්ඩා මහතාට අයත් ගොඩ ඉඩම
06. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
07. යූ. ආර්. බී. වීරකෝන් මහතාට අයත් ගොඩ ඉඩම
08. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
09. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
10. එස්. බී. වීරකෝන් මහතාට අයත් ගොඩ ඉඩම

*වම්පස ඉඩම්හිමියෝ*

01. නාලක මඩවල මහතාට අයත් කුඹුරු ඉඩම
02. ජේ. එම්. රන්බණ්ඩා මහතාට අයත් ගොඩ ඉඩම
03. ඩී. බී. කළුගල්ල මහතාට අයත් ගොඩ ඉඩම
04. එච්. එම්. හීංබණ්ඩා මහතාට අයත් ගොඩ ඉඩම
05. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
06. යූ. ආර්. බී. වීරකෝන් මහතාට අයත් ගොඩ ඉඩම
07. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම
08. ජේ. එම්. රත්නායක මහතාට අයත් ගොඩ ඉඩම

08-398/2

**නවගත්තේගම ප්‍රාදේශීය සභාව**

ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 1989 අංක 12 දරන පළාත් සභා (අනුශාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ 2007.05.18 දිනැති අංක 1498 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* iv "අ" වැනි පළාත් සභා කොටසේ පළ කර ප්‍රාදේශීය සභාවට පිළිගැනීමට බලය පවරන ලද, ප්‍රාදේශීය සභාවන්හි මහජන පුස්තකාල සඳහා වූ අතුරු ව්‍යවස්ථාව මෙම *ගැසට් පත්‍රයේ* පළ කරන ලද දින සිට නවගත්තේගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමට 2008.08.30 වැනි දින පැවති මෙම ප්‍රාදේශීය සභා මාසික සභා රැස්වීමේ දී තීරණය කර ලද බව අංක 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභාපනතේ 221(අ) වගන්තිය සමග කියිවිය යුතු 122 හා 126 වැනි වගන්ති වලින් ලැබී ඇති බලතල ප්‍රකාරව මෙයින් දැනුම් දෙමි.

ආර් පී. ඩී. යූ. රාජරරත්න,
සභාපති *(වැඩබලන)*,
නවගත්තේගම ප්‍රාදේශීය සභාව.

2009 මාර්තු මස 30 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

08-506

# විවිධ දැන්වීම්

**මාතර මහ නගර සභාව**

විනෝද බදු ආඥාපනත

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මාතර මහ සභාව විසින් සම්මත කරන ලද පහත සඳහන් යෝජනාව, එකී වගන්තියේ (2) වීන උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර දකුණු පළාතේ පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යවරයා විසින් අනුමත කර ලද බව එකී උපවගන්තිය අනුව මෙයින් පළකරනු ලැබේ.

යෝජනාව

(267 වැනි අධිකාරය වූ) විනෝද බදු ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මාතර මහ නගර සභාව, සභාවේ පරිපාලන සීමා ඇතුළත වූ ප්‍රදේශයෙහි පවත්වනු ලබන, එකී ආඥාපනතේ විස්තර කර ඇති විනෝද කටයුත්තකට ඇතුළුවීම පිණිස කරනු ලබන, ගෙවීමකින් (විනෝද බදු හැර) පහත සඳහන් අනු ප්‍රමාණයෙන් නොඉක්මවන බද්දක් පනවා අයකළ යුතු යයි ද මෙම යෝජනා සම්මතය, *ගැසට් පත්‍රයේ* පළකරන ලද මාසයට ඉක්බිතිවම එළඹෙන මාසයේ පළමුවන දින සිට ක්‍රියාත්මක විය යුතු යයි ද යෝජනා කරන්නීය.

| *ඇතුළුවීමට ගෙවන ලද මුදල* | *බදු ප්‍රමාණය රුපියල්* | *සම්පූර්ණ වටිනකම* |
|---|---|---|
| රු. 28.58 නොඉක්මවන අවස්ථාවක | 1.42 | 30 0 |
| රු. 28.58ට වැඩි නමුත් ර. 47.62 නොඉක්මවන අවස්ථාවක | 2.38 | 50 0 |
| රු. 47.62ට වැඩි නමුත් රු. 66.67 නොඉක්මවන අවස්ථාවක | 3.33 | 70.00 |
| රු. 66.67 ට වැඩි නමුත් රු. 76.20 නොඉක්මවන අවස්ථාවක | 3.80 | 80.00 |
| රු. 76.20 ට වඩිනමුත් රු. 85.72 නොඉක්මවන අවස්ථාවක | 4.28 | 90 0 |
| රු. 85.72ට වැඩි නමුත් 95.24 නොඉක්මවන අවස්ථාවක | 4.76 | 100 0 |
| රු.95.24ට වැඩි නමුත් රු. 119.05 නොඉක්මවන අවස්ථාවක | 5.95 | 125 0 |
| රු.119.05 ට වැඩි නමුත් රු. 142.86 නොඉක්මවන අවස්ථාවක | 7.14 | 150 0 |
| ර.142.86ට වැඩි නමුත් රු. 166.67 නොඉක්මවන අවස්ථාවක | 8.33 | 175 0 |
| රු. 166.67ට වැඩි නමුත් රු. 190.48 නොඉක්මවන අවස්ථාවක | 9.52 | 200 0 |

එසේ වුව ද මෙම යෝජනා සම්මතය ක්‍රියාත්මක වන පළමු දෙවසර ඇතුළත චිත්‍රපටියක් නැරඹීම සඳහා ගෙවනු ලබන ගාස්තුව මත අයකළ යුතු බදු මුදල, එසේ ගෙවන ලද ගාස්තුවෙන් සියයට පහක් විය යුතුය.

එම්. ඩබ්. විජේතිලක,
ලේකම්,
ප්‍රධාන අමාත්‍ය, නීතිය හා සාමය, ප්‍රවාහන,
ජල සම්පාදන හා ජලාපවාහන, විදුලිබල,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය හා පළාත් පාලන
අමාත්‍යාංශය,
දකුණු පළාත.

2010 ජූලි මස 13 වැනි දින,
ගාල්ලේ දී ය.

08-426

-

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.